**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2021**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

සහාධිපත්‍ය කළමනාකරණඅධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින්විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් ඇති හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තකසේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වන හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේඅදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන්හෝතත්ත්වයන්හේතුවෙන්අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
  - තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණපහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 නියමන්ට අනුකූල නොවන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා තිබුණු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ සහ ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් පිළිවලින්රු. 2,497,310 ක් හා රු. 1,667,982 බැගින් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දැක්වුණි. | වැරද්ද නිවැරදි කර සංශෝධිත මුදල ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය | දැනට භාවිතා කරන වත්කම් හැර අනිකුත් වත්කම් වලින් බොහොමයක් අපහරණය කර | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. 11,219,837 ක්වූ වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ගිණුම්කරණ ප්‍රමිති අංක 3 හි නියමයන්ට අනුකූලව මෙම වත්කම්වල ඵලදායි ජීවිත කාලය පිළිබඳව සිදුකර තිබුණු ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඇති අතර ඉතිරි වත්කම් 2022 ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවන පරිදි 2019 වර්ෂයේදී අධිකාරියේ වාහන රු. 62,390,000 කට නැවත ප්‍රතිගණනය කර තිබුණු අතර එම ප්‍රතිගණන වටිනාකම් ගිණුම්වල ගැලපීමට 2021 වර්ෂය දක්වා ප්‍රමාද වී තිබුණු අතරම මෙම වාහන වලට 2019 හා 2020 වර්ෂවලට අදාල කාලය සඳහා ක්ෂය ගැලපීම් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 දී ප්‍රත්‍යාගණන වටිනාකම් ගිණුම්ගත කර ඇත. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී සිදුකරතිබූ වාහන අළුත්වැඩියා හා නඩත්තු වියදම | 3,852,237 | අළුත්වැඩියාවන්ට අදාල ලිපිගොනු | වාහන අළුත්වැඩියා හා නඩත්තු පිළිබද වාර්තාවක් 2022.6.20 ඉදිරිපත් කර ඇත. | විගණනයට අවශ්‍ය තොරතුරු අවශ්‍ය කාලය තුලදී ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ විෂය පථය තුල නැති කාර්යයක් වූ ගම්පහ සහ මීගමුව රෝහල්වල පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.7,782,979 ක ශේෂයෙන් රු.5,940,770 ක ශේෂයක් වසර 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුණි. | මීගමුව රෝහලට අදාල හිගමුදල ලබාගැනීමට රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇත. ඒ අනුව දිගින් දිගටම සාකච්ඡා කරමින් පවතී. ගම්පහ රෝහලෙන් අදාල හිගමුදල් ලබාගැනීමෙන් පසු 2022.09.30 දින සිට නඩත්තු කටයුතු වලින් ඉවත්වීමට නියමිතය. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,335,030 ක් වූ ණය ගැති ශේෂය තුල මාදිවෙල පාර්ලිමේන්තු නිවාස සංකීර්ණය සඳහා පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු රු.1,244,093 ක්ද , සභාධිපත්‍ය දේපල 159 කින් සමතකරණ ගාස්තු රු. 2,671,161 ක් හා ජල්තර රජයේ සේවක නිවාස සංකීර්ණයේ නිවැසියන් 53 ගෙන් අයවිය යුතු රු. 419,775 ක්ද පැවති අතර එම ණයගැති ශේෂය තුල වර්ෂ 05 ට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ලැබිය යුතු ශේෂ එකතුව රු.3,090,936 ක් විය. | සමතකරණ ණයගැති ශේෂ අයකර ගැනීමට නොහැකි වී ඇති බැවින් පොත්වලින් ඉවත් කිරීම සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට අපේක්ෂා කරන අතර ඉතිරි ණය සඳහා අභ්‍යන්තර කමිටුවක් පත්කෙරේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය (සංශෝධිත 2021-11-17 දින සිට | රාජ්‍ය සංස්ථාවක අතිරේක අරමුදල්, ආයෝජනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ | මුදල් ඇමතිවරයා දැනුවත් කර අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාත්මක රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ මාර්ගෝපදේශයේ 6.2) හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ආයෝජනය කළයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද රු.463,238,430 ක ස්ථාවර තැන්පතු 05 ක් සම්බන්ධයෙන් නීතිරීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2021/11/16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2021 මගින් නිකුත් කර ඇති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතෙහි 3 පරිච්ඡේදයේ 3.2 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කළ ආයතනයේ ක්‍රමෝපායික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව සේවක කාර්ය සාධනය මැනීම සඳහා පිළියෙල කරන ලද ක්‍රමවේදයන් මගින් සහතික විය යුතු වුවත් අධිකාරිය කිසිදු ඇගයීම් ක්‍රමවේදයකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 8,062,180 ක දිරිදීමනා ගෙවීම් කර තිබුණි. | සේවක කාර්යසාධනය මැනීම සඳහා ක්‍රමවේදයක් මූල්‍ය අංශය විසින් සැළසුම් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමුකිරීමට නියමිතය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ බදු පෙර ලාභය රු.206,261,702 ක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු.44,534,661 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.161,727,042 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු.167,774,162 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි 05 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව සහාධිපත්‍ය දේපල සංවර්ධනය සඳහා ලබාදෙන මූලික නිශ්කාශන ලිපියක වලංගු කාලය වසර 03 ක් පමණක් | මූලික නිශ්කාෂණ ලිපි නිකුත් කර අවුරුදු 03 ඉක්මවූ ව්‍යාපෘති සඳහා අවසාන සහතික නිකුත් කිරීමට පෙර මූලික නිශ්කාෂණ ලිපිය | වලංගු කාල තුළ සහතික පත්‍ර නිකුත් කිරීමට නිසි ක්‍රම වේදයක් සකස් කර |

| | | | |
|---|---|---|---|
| | වුවද 2011 වර්ෂයේ සිට 2018 දක්වා කාලය තුළ නිකුත් කර තිබූ මූලික නිශ්කාශන ලිපි 682 ක වලංගු කාලය ඉක්මවා තිබියදීත් සහාධිපත්‍ය කළමනාකරණ සහතික ලබානොගත් දේපලහිමියන් සඳහා ප්‍රමාද ගාස්තුවක් අයකිරීමට අධිකාරිය කටයුතුකර නොතිබුණි. | අළුත්කර අවසාන සහතික නිකුත් කිරීමට 2022 වර්ෂයේ සිට කටයුතු කෙරේ. | ගත යුතුය. |
| (ආ) | පනතේ 09 (අ) (1) වගන්තියට අනුව සහාධිපත්‍ය දේපලක් තුළ අනවසර ඉදිකිරීම් පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අවස්ථාවෝචිතව ක්‍රියා කළ යුතු වුවත් 2013 සිට 2021 දක්වා ලැබී තිබූ පැමිණිලි 16 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු සිදුකර නොතිබුණි.ඒසේම සහාධිපත්‍ය දේපලක කොටසක් ගනු ලැබූ ගැණුම්කරුවෙකු විසින් පොදු පහසුකම් සම්බන්ධයෙන් සිදුකරනු ලබන ලිඛිත පැමිණිල්ලක් සම්බන්ධයෙන් පනතේ 9 (ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් ලැබුණු පැමිණිලි 75 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සහාධිපත්‍ය දේපල නීතිය යටතේ වූ 1982 අංක 45 දරන බද්ධ නිවාස (සංශෝධන) පනතේ වූ ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛන එකතු කිරීම යටතේ 3 (2) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සංස්ථා වල වාර්ෂික මහාසභා රැස්වීම් පැවැත්විය යුතු අතර එහි 8 (4) (අ) අනුව සංස්ථාවේ විගණනය කළ වාර්ෂික ගිණුම් වාර්තා වල පිටපතක් අධිකාරියට ඉදිරිපත් කළ යුතුවේ. නමුත් කළමනාකරණ සංස්ථා 101 ක වාර්ෂික මහා සභා රැස්වීම් මාස 15 සිට මාස 37 දක්වා කාලයක් ගතවී ඇතත් පවත්වා නොතිබුණි. තවද විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමක් සහ අධීක්ෂණයක් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි. | ගෝලීය වසංගත තත්ත්වය මත සියළු රැස්වීම් අත්හිටුවා තිබීම හා සංචරණ සීමා කිරීම් මත රැස්වීම් පැවැත්වීමට නොහැකිවිය. | අධිකාරිය කළමනාකරණ සංස්ථා සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඈ) | 1977 වර්ෂයේ සිට අධිකාරි කාර්යාලය පවත්වාගෙන යන ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිලි පරිශ්‍රය සඳහා ආයතන දෙක අතර එකගවූ ගිවිසුමක් නොතිබුණු අතර 2018/2019 හා 2019/2020 යන වර්ෂ වලදී වර්ෂයකට රු.4,848,660 | අවසාන එකගතාවයකට පැමිණ නැති බැවින් ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වී තිබේ. | දෙපාර්ශවය විසින් ගිවිසුම්වලට එළඹීමට කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් බැගින් කුලී ගෙවා තිබුණි. 2021 වර්ෂයේ සිට කුලිය රු.8,400,000 දක්වා වැඩිකිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2020 නොවැම්බර් 27 දිනැති ලිපියෙන් දන්වා තිබූ නමුත් 2022 ජූනි 21 දින දක්වාම විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. ලිපිය අනුව 2021 වර්ෂෙය් කුලී වියදම් ගිණුම් ගතකර තිබූ අතර ඊට අමතරව ඒකගතාවයකින් තොරව ගොඩනැගිල්ල සඳහා ටයිල් ඇල්ලීමට රු.748,871 ක් ද අනිකුත් නඩත්තු කටයුතු වෙනුවෙන් රු.3,384,835 ක්ද වන ලෙස සමාලෝචිත වර්ෂයේ වියදම් කර තිබුණි. | | |
| (ඉ) | වසර 02 කට වැඩි කාලයක් ගතවී ඇතත් අවසන් නොකල විනය පරීක්ෂණ 02 ක් පැවති අතර ඒ වෙනුවෙන්ද එකතුව රු.72,227 ක් වැයකර තිබුණි. මෙම විනය පරීක්ෂණවලදී අදාල නිළධාරීන් සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/2019 පරිදි කටයුතු කර නොමැති බව ද නිරීක්ෂණය විය. | විනය පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

3.2 **වාහන පද්ධති කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 ඔක්තෝබර් 01 දින අනතුරකට පත්වූ වාහනයක රු.251,350 ක අළුත්වැඩියා කටයුතු 2019 දෙසැම්බර් 23 දින අවසන් කර තිබූ අතර මු.රෙ.104 (4) වාර්තාව අනුව වරදකරුගෙන් එම මුදල අයකර ගතයුතු වුවත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වාහනය 2022 පෙබරවාරි 23 දින දක්වාම ගරාජයෙන් නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගරාජයෙන් නිදහස් කර ගැනීමට කටයුතු කර ඇත. | අළුත්වැඩියා කටයුතු සිදුකර වාහනය භාවිතයට ගතයුතුය. |
| (ආ) | 2020 පෙබරවාරි 08 දින අනතුරකට පත් වූ වාහනයක අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව රක්ෂණයෙන් ආවරණය නොවන අළුත්වැඩියා වියදම රියදුරු ගෙන් අයකිරීමට තිරණය කර තිබූ නමුත් වසර 02 කට වැඩි කාලයක් ගතවී ඇතත් අමතර කොටස් නොමැතිබව සඳහන් කරමින් අළුත්වැඩියා නොකර ආයතන පරිශ්‍රයේ රඳවා තිබුණි. | අමතර කොටස් නොමැති බැවින් අළුත්වැඩියා කර නැත. | කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 19 දින අනතුරකට පත් වාහනයක ඇස්තමේන්තු අළුත්වැඩියා වියදම රු.2,764,012 ක් වූ අතර මු.රෙ.104 (4) වාර්තාව අනුව රියදුරු වරදකරු නොවන බවත් තෙවන පාර්ශවයෙන් අයකර ගත යුතු බවට තීරණය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පවතින නඩුව අවසන් වී නොමැති අතර වසර 02 කට වැඩි කාලයක් වාහනය අළුත්වැඩියා නොකර අධිකාරි පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | රක්ෂණ ආවරණයෙන් රු.ලක්ෂ 05 ක් පමණක් ලබා ගැනීමට හැකියාව ඇති අතර ඉතිරිය තෙවන පාර්ශවයෙන් අයකර ගැනීමට නඩු පවරා ඇත. අළුත්වැඩියාවට සඳහා මිල ගණන් කැඳවා ඇත. | කඩිනමින් වාහන අළුත්වැඩියාව සිදුකළ යුතුය. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අධිකාරියේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 139 ක් හා 115 ක් ද පුරප්පාඩු 24 ක් ද වූ අතර ඒ තුළ මාණ්ඩලික තනතුරු 14 ක පුරප්පාඩු පැවතුණි. ඉහත මාණ්ඩලික තනතුරු 07 ක් 2010 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවති නමුත් අධිකාරිය විසින් එම තනතුරු පිරවීමට 2022 ජූලි 07 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. | අත්‍යාවශ්‍ය තනතුරු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.4** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 (ඉ) අනුව සහාධිපත්‍ය දේපල සඳහා පිහිටවනු ලබන කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම අධිකාරිය විසින් සිදුකළ යුතු වුවත් අධිකාරිය යටතේ 2020 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සංස්ථා 1,079 ස්ථාපිත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය 951 දක්වා අඩුවී තිබුණි. එම 951 කින් | අදහස් දක්වා නැත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ද 557 ක් ක්‍රියාකාරී නොවන මට්ටමක පැවති අතර ඒ අනුව අධිකාරිය නිසි පරිදි නියාමණයන් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | | |

4 **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**-----------------------------------------**

4.1 **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**------------------------------**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය ඉලක්කයන් දක්වා නොතිබූ අතර භෞතික ඉලක්කයන්ද ප්‍රතිශතයක් ලෙස පමණක් දක්වා තිබූ අතර එම ඉලක්කයන් ලගාකර ගැනීම් පිළිබද කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | සම්මත ආකෘතියකට අනුව මූල්‍ය හා භෞතික ඉලක්කයන් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතු අතර කාර්ය සාධන වාර්තා ද විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

**-------------------**

| | | |
|---|---|---|
| ආදායම් විෂයයන් 07 ක් යටතේ අයවැයගත ආදායම් එකතුව රු.1,470,000 ක් සමාලෝචිත වර්ෂයේ ලගාකර ගැනීමට නොහැකිවී තිබූ අතර විෂයන් 05 ක අයවැයගත වියදම සියයට 37 සිට සියයට 116 දක්වා ප්‍රතිශතයකින් එනම් රු.27,492,789 කින් වැඩිවී තිබුණි. තවද අයවැය ලේඛනයට ඇතුළත් නොවූ වැය විෂයයන් 02 ක් සඳහා වූ රු.25,900,000 ක් සමාලෝචිත වර්ෂයේ වැයකර තිබූ අතර වැය විෂයයන් 04 ක් සඳහා අයවැයෙන් වෙන්කර තිබූ රු.108,500,000 ක් වැය නොකර ඉතිරිව තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය. | රටේ පැවති තත්ත්වයන් අනුව විචලනයන් සිදුවී ඇත. | අයවැය ලේඛන ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |